**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2016 ඔක්තෝබර් 27** **ක්ෂුද්‍රමූල්‍ය පනතේ රීති** **2016 අංක 02**

# බලපත්‍ර ගාස්තුව

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 13(2) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. ආරම්භක බලපත්‍ර ගාස්තුව

1.1. බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් බලපත්‍රය ලබා ගනු ලබන වර්ෂය සඳහා රුපියල් පනස්දහසක (රු. 50,000/-) මූලික බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු අතර එය බලපත්‍රය ලබා ගන්නා දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවිය යුතුය.

2. වාර්ෂික බලපත්‍ර ගාස්තුව

2.1. සෑම බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්ම බලපත්‍රය ලබාගත් පසුව එළඹෙන සෑම වර්ෂයක් සඳහාම පහත පරිදි සමාගමේ මුළු වත්කම් මත පාදක වූ බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු අතර එය අදාල වර්ෂයේ ජනවාරි 31 හෝ ඊට පෙර ගෙවිය යුතුය.

| පසුගිය වසර අවසාන දිනට මුලු වත්කම් එකතුව | වාර්ෂික බලපත්‍ර ගාස්තුව (රු) |
|---|---|
| රු. මිලියන 250 හෝ ඊට පහල | 50,000/- |
| රු. මිලියන 250 සිට රු. මිලියන 500 දක්වා | 100,000/- |
| රු. මිලියන 500 සිට රු. මිලියන 750 දක්වා | 150,000/- |
| රු. මිලියන 750 සිට රු. බිලියන 01 දක්වා | 200,000/- |
| රු. බිලියන 01 ට ඉහල | 250,000/- |

ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
මුදල් මණ්ඩලයේ සභාපති
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති